## උදේනි චන්ද්‍රසිරි එ. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 1615 /2019 (2020.02.05 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - උදේනි චන්ද්‍රසිරි
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

**පෙනීසිටීම**
අභියාචක - උදේනි චන්ද්‍රසිරි
පොදු අධිකාරිය - උදාරි පඬුවාවල, සහකාර පුස්තකාලාධිපති
කේ.ඒ.සී. ද අල්විස්, නීති නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.03.25 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.03.29, 2019.05.03 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.05.09 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.06.07 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.03.25 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදී.

*ටවර් හෝල් රඟහල පදනම හා ඉදිකිරීම් කර්මාන්ත අධිකාරිය සමඟ අත්සන් කළ "සවිසිරිපාය" ගොඩනැගිල්ල ඉදිරි වසර 30 කට භුක්තිය භාරදීමේ ගිවිසුම*

පොදු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2019.05.03 දිනැතිව අභියාචක වෙත දන්වා ඇත්තේ තොරතුරු පනතේ 5(1)(අ) වගන්තිය ප්‍රකාරව එම තොරතුරු ලබාදිය නොහැකි බවයි. මින් අතෘප්තියට පත් අභියාචක 2019.05.09 දිනැතිව නම්කළ නිලධාරියාට අභියාචනය කළ අතර නම්කළ නිලධාරියා පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2019.02.18 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශවයම පැමිණ ඇති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

මෙහිදී පොදු අධිකාරිය විසින් කරුණු දක්වා සිටින ලද්දේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු, තොරතුරු පනතේ 5(1)(අ) වගන්තිය ප්‍රකාරව ලබා දිය නොහැකි බවයි.

මෙහිදී කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියෙන් විමසා සිටින ලද්දේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරිය පවසන පරිදි පෞද්ගලිකත්වය සම්බන්ධ තොරතුරු යන ගණයට අයත් වන්නේ කෙසේද යන්නයි. පොදු අධිකාරිය විසින් වැඩිදුරටත් කරුණු දක්වා සිටින ලද්දේ අදාළ ගිවිසුම සම්බන්ධ තොරතුරු මේ වන විට කැබිනට් මණ්ඩලයට යොමුකර ඇති බවයි.

අභියාචක විසින් කරුණු දක්වා සිටින ලද්දේ තමා විසින් ගිවිසුමක තොරතුරු පමණක් ඉල්ලා සිටින ලද අතර 1968 වර්ෂයේදී ඒකපාර්ශවික ලෙස අත්සන් කරන ලද ගිවිසුමකට අන්තර්ගත කරන ලද කරුණුම මෙම ගිවිසුමටද ඇතුළත් කර ඇති බවයි.

**නියෝගය:**

අදාළ ගිවිසුම සම්බන්ධ තොරතුරු කැබිනට් මණ්ඩලයට යවා ඇති බවට පොදු අධිකාරිය සඳහන් කරන බැවින් ඒ පිළිබඳ තොරතුරු මීලඟ අභියාචනා විභාගයේදී කොමිෂන් සභාවට පැහැදිලි කරන මෙන් පොදු අධිකාරියට මින් නියෝග කරනු ලැබේ.
තවද අභියාචකගේ ස්ථාවරය වන, ඉල්ලා ඇති තොරතුරු දැනට අවසන් තීරණයක් නොලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට අදාළ නොවන බව, තහවුරු කරන ලෙසට නියෝග කරනු ලැබේ.
මීළඟ අභියාචනා විභාගය 2020.05.05 දින ප.ව. 2.00ට කල්තබනු ලැබේ.

---

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ 1286/2019 (2020.07.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - උදේනි චන්ද්‍රසිරි
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, **ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**පෙනීසිටීම**
මෙය ලේඛනගත කාර්යපටිපාටිය හරහා විභාග කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

රට තුළ COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටිනුයේ 2020.02.05 දිනැතිව කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියට නියම කළ පරිදි 'අදාළ ගිවිසුම සම්බන්ධ තොරතුරු කැබිනට් මණ්ඩලයට යවා ඇති බවට පොදු අධිකාරිය සඳහන් කරන බැවින් ඒ පිළිබඳ තොරතුරු මීළඟ අභියාචනා විභාගයේදී කොමිෂන් සභාවට පැහැදිලි කරන ලෙසත් සිදුකළ නියෝගය හා අභියාචකගේ ස්ථාවරය වන, ඉල්ලා ඇති තොරතුරු දැනට අවසන් තීරණයක් නොලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට අදාළ නොවන බව තහවුරු කරන ලෙස' අභියාචකට කළ නියෝගයත් පරිදි දෙපාර්ශ්වයම ක්‍රියා කර නොමැති බවයි.

නියෝගය:

ඒ අනුව 2020.02.05 දිනැති නියෝගය ප්‍රකාරව පොදු අධිකාරියට නියම කළ පරිදි 'අදාළ ගිවිසුම සම්බන්ධ තොරතුරු කැබිනට් මණ්ඩලයට යවා ඇති බවට පොදු අධිකාරිය සඳහන් කරන බැවින් ඒ පිළිබඳ තොරතුරු මීළඟ අභියාචනා විභාගයේදී කොමිෂන් සභාවට පැහැදිලි කරන ලෙසත් හා අභියාචකගේ ස්ථාවරය වන, ඉල්ලා ඇති තොරතුරු දැනට අවසන් තීරණයක් නොලද අමාත්‍ය මණ්ඩල සංදේශයකට අදාළ නොවන බව තහවුරු කරන ලෙස' අභියාචකට කළ නියෝගය අනුව කටයුතු කිරීමටත් දෙපාර්ශ්වයටම නියෝග කරන අතර දෙපාර්ශ්වයේම ලිඛිත කරුණු දැක්වීම් මෙම නියෝගය ලද දින සිට මාසයක කාලයක් තුළ කොමිෂන් සභාවට යොමු කිරීමටත් නියෝග කෙරේ.

ඒ අනුව මීළඟ අභියාචනා විභාගය 2020.08.18 දිනට කල්තබනු ලැබේ.

---

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ 1615/2019 (2020.08.18 දින පැවති වීඩියෝ කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - උදේනි චන්ද්‍රසිරි
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**

මෙය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

රට තුල COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ පෙර අභියාචනා අවස්ථාවේදී පොදු අධිකාරියට නියෝග කළ පරිදි 'අදාළ ගිවිසුම සම්බන්ධ තොරතුරු කැබිනට් මණ්ඩලයට යවා ඇති බවට පොදු අධිකාරිය සඳහන් කරන බැවින් ඒ පිළිබඳ තොරතුරු මීළඟ අභියාචනා විභාගයේදී කොමිෂන් සභාවට පැහැදිලි කරන ලෙස' කළ නියෝගයට පැහැදිලි පිළිතුරක් 2020.07.07 දිනැතිව පොදු අධිකාරිය විසින් යොමුකරන ලද ලිපියේ සඳහන් නොවන බවයි.

මෙහිදී කොමිෂන් සභාව විසින් තවදුරටත් අවධාරණය කර සිටිනුයේ අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය තවමත් අවසන්ව නොමැති නම් එය 5(1)(ක) යටතේ ලබාදිය නොහැකි සේම අමාත්‍ය මණ්ඩල සංදේශය මේ වන විට අවසන්ව ඇත්නම් එය ලබා දිය හැකි බවයි. ඒ අනුව එහි තත්වය නිශ්චිතවම කොමිෂන් සභාව වෙත දැන්වීමට පොදු අධිකාරිය කටයුතු කළ යුතුය.

**නියෝගය:**

ඒ අනුව ඒ අනුව අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ අවසනාත්මකභාව පිළිබඳ තත්වය නිශ්චිතව මාසයක් ඇතුළත කොමිෂන් සභාවට දැන්විය යුතු බවට පොදු අධිකාරියට නියෝග කර සිටින අතර ඒ මත පදනම්ව මීළඟ අභියාචනා දිනයේදී අවසාන නියෝගයක් ලබා දීමට කටයුතු කෙරේ.
මීළඟ අභියාචනා විභාගය 2020.10.13 දිනට කල්තබනු ලැබේ.

---

RTIC Appeal (**ලේඛනගත කාර්යපටිපාටිය**)/ 1615/2019 (2020.10.13 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - උදේනි චන්ද්‍රසිරි
**නොතිසි ලත් පාර්ශවය** - නම් කළ නිලධාරී, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**පෙනීසිටීම**
මෙය පාර්ශ්වයන්ගේ ලිඛිත කරුණු දැක්වීම් මත පදනම්ව විභාග විය.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

රට තුල COVID-19 හේතුවෙන් හටගෙන ඇති සෞඛ්‍ය තත්වය හේතුවෙන්, පුද්ගල ආශ්‍රය අවම කිරීම සඳහා, දැනට කොමිෂන් සභා රීතින්හි, රීති අංක 20 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) යටතේ පුද්ගලික විභාග කිරීම් සඳහා දින නියම කොට ඇති අභියාචනා මුල් වාරයේ, රීති අංක 19 හි ලේඛනගත කාර්යය පටිපාටිය යටතේ සලකා බලනු ලැබේ. ඒ අනුව මෙම අභියාචනය ගොනුවේ ඇති ලේඛන මත පදනම්ව කොමිෂන් සභාව විසින් සලකා බැලීමෙන් අනතුරුව පහත නියෝගයන් නිකුත් කරන ලදී. ඉහත ක්‍රියාපටිපාටිය පසු කාලීනව වෙනස් වීමට ලක්විය හැකිය.

මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ පසුගිය අභියාචනා විභාගයේදී ලබාදුන් තීරණය ප්‍රකාරව කටයුතු කිරීමට පොදු අධිකාරිය විසින් අපොහොසත් වී ඇති බවයි. එනම්, "අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ අවසනාත්මකභාව පිළිබඳ තත්වය නිශ්චිතව මාසයක් ඇතුළත කොමිෂන් සභාවට දැන්විය යුතු බවට පොදු අධිකාරියට නියෝග කර සිටි". ඒ අනුව පොදු අධිකාරිය විසින් අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ අවසානාත්මකභාවය පිළිබඳව දැන්වීමට අපොහොසත් වී ඇත.

**නියෝගය:**

ඒ අනුව අභියාචනයේ ඇති සියලු කරුණු සළකා බලමින් අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු සති දෙකක කාලයක් ඇතුළත අභියාචක වෙත ලබාදීමටත් එම තොරතුරු ලබාදීමේ ආවරණ ලිපියේ පිටපතක් කොමිෂන් සභාවට යොමුකිරීමටත් යටත්ව මෙම අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****